**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - 2022**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි 03 හා 08 ඡේද ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන, වාර්තා කරන දිනය හා ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය හිමිවන දින අතරතුර කාලයේදී, වාර්තා කරන දිනට පැවති තත්ත්වය පිළිබඳව සාක්ෂි සපයන ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතු වුවද, සංස්ථාවට එරෙහිව පැවති නඩු 02 ක් සම්බන්ධයෙන් ලබාදී තිබූ තීන්දු ප්‍රකාරව අදාල නිලධාරීන්ට ගෙවිය යුතු රු.4,645,296 ක හිඟ වැටුප් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. 2023 වර්ෂයේදී හිඟ වැටුප් ගෙවීම් සිදුකර ඇත. | ප්‍රමිතියේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 34 වන ඡේදය ප්‍රකාරව සංස්ථාවේ දේපළ පිරියත හා උපකරණ වල සාධාරණ අගය කාලීනව වෙනස්වීම මත එම වත්කම් වසර 03 කට | ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා ක්‍රියාකරමින් පවතී. | ප්‍රමිතියේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කළයුතු වුවත්, සංස්ථාව විසින් රු.441,813,407 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි ප්රත්‍යාගණනය කර නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් එකතුව රු.154,976,666 ක් වටිනා ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති අතර ප්‍රමිතයේ අංක 79(ආ) ඡේදය ප්‍රකාරව එම වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. ඒ අනුව එම වත්කම්වල ඵලදායී ජීව කාලය පිළිබඳ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. ස්ථාවර වත්කම් ලේඛනයේ භෞතිකව හඳුනා ගැනීමක් සිදුකර 2023 වර්ෂයේ ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතියේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සෙමින් චලනය වන සහ චලනය නොවන තොගයෙහි මුළු වටිනාකම රු.8,597,176 ක් විය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 79 (අ) ඡේදය ප්‍රකාරව නිශ්කාර්ය වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ පොත් අගයට හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථා පරිශ්‍රය තුළ හා ඉන් පිටත සංස්ථාවට අයත් ගොඩනැගිලි තුළ පවතින නිශ්කාර්ය වත්කම් හා යල් පැනගිය පැරණි වත්කම් පිළිබඳ ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. එම තොගයෙහි වටිනාකම සනාථ කරගැනීම සඳහා අවශ්‍ය විස්තරාත්මක ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය. | නිරීක්ෂණ නිවැරදිය. 2013 වර්ෂයේදී ගිණුම් ප්‍රමිත අනුව සකස් කිරීමේදී වෙන්කර ඇති වටිනාකමකි. තොග සමීක්ෂණ වාර්තාවෙන් සකස් කරන ලද උපලේඛනයකින් මෙම වෙන්කිරීම සිදුකර ඇත. | ප්‍රමිතියේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් 02 ක පැවති එකතුව රු. 19,812,600 ක් වූ ශේෂයන්ට අනුරූපී වන අයුරින් එකතුව රු. 21,263,945 ක හර හා එකතුව රු. 1,451,345 ක බැර වටිනාකම් | ලෙජර් ගිණුම් 02හි ආරම්භක ශේෂයන් අතර වෙනස හේතු පහත පරිදි වේ.<br>Peoples Bank 004100110208647<br>2021.12.31 දිනට මුදල් පොතට අනුව ශේෂය රු. 373,994 | ලෙජර් ගිණුම් තුල ආරම්භක ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇතුළත් කර සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් සටහන් කර තිබුණි. එම හර හා බැර ශේෂයන් සනාථ කිරීමට අදාල ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය. | කි. බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය රු. 931,060 කි. 2021.12.31 දිනට නිශ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු. 557,066 කි.<br>BoC Bank – 2323354<br>2021.12.31 දිනට මුදල් පොතට අනුව ශේෂය රු19,438,606 කි. බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය රු.20,332,885 කි. 2021.12.31 දිනට නිශ්කාශනය නොවූ චෙක්පත් වල වටිනාකම රු. 894,279 කි. | |
| (ආ) | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් 03 ක ශේෂයන්ගේ එකතුව රු. 5,346,024 ක් වුවත් එම ලෙජර් ගිණුම්වල සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස එකතුව රු.7,357,214 ක් දක්වා තිබීමෙන් ශේෂයන් අතර රු.2,011,190 ක වෙනසක් පැවතුණි. | ලෙජර ගිණුම් 03 හි ආරම්භක ශේෂ වල වෙනස 2021.12.31 දිනට මුදල් පොතට හා බැංකු ප්‍රකාශනයට අනුව ශේෂයන් අතර වෙනස්කම් වේ. | ආරම්භක ශේෂයන් නිවැරදි කිරීමට පියවරගත යුතුය. |
| (ඇ) | ලෙජර් ගිණුම් අංක 60-1271 හා 70-3422 යටතේ දක්වා තිබුණු සේවක ණය පොළී ගිණුම් 02 හි පැවති රු. 1,467,383 ක හර හා බැර ශේෂයන් එකිනෙකට හිලව් කර තිබුණද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මේ පිළිබඳ අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | සංස්ථා සේවක ආපදා ණය සඳහා අයකරනු ලබන පොලී ප්‍රතිශතය 4%කි. වර්ෂ අවසානයේදී බැංකු ණය පොලී අනුපාතය හා සංස්ථා සේවක ණය පොලී අනුපාතිකය අතර වෙනස මෙම සේවක ණය පොලී (වත්කම්) හා වගකීම් ගිණුම් තුල ගලපනු ලබයි. එම ගිණුම් දෙක මඟින් හිලව් වී ඇති රු. 1,467,383 ක ශේෂය 2019 වර්ෂයේදී ණය පොලී අනුපාත ගැලපීම වන අතර අතපසුවීමකින් 2019 වර්ෂයෙන් පසු මෙම ගැලපීම සිදු කර නොමැත. 2023 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතියේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සංස්ථාවේ පරිගණක ගිණුම්කරණ පද්ධතිය (Quick Book) තුලින් ලබා ගන්නා ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව මුළු වත්කම්වල වටිනාකම රු. 1,103,950,458 ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය | වෙනස්කම් හඳුනා ගන්නා ලදි. 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | හඳුනා ගන්නා ලද වෙනස්කම් ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තත්ත්ව ප්‍රකාශනය අනුව එම වටිනාකම රු.1,247,881,012 ක් වූයෙන් එම ශේෂ අතර රු. 143,930,554 ක වෙනසක් නිරීක්ෂණය විය. | | |
| (ඉ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් නොවන, රු.13,600,000 ක් වූ මෝටර් රථ ප්‍රදාන සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයට ගලපන ලද රු. 26,450,000 ක් වූ මෝටර් රථ ප්‍රත්‍යාගණන ලාභය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් චලනය කෙරෙහි බලනොපාන විෂයයන් යටතේ දක්වා තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. නැවත ප්‍රත්‍යාගණනයක් සිදුකරන අවස්ථාවේදී මෙය නිවැරදිව ගැලපීමට කටයුතු කරනු ලැබේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් වටිනාකමරු. 30,939,853 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල එම වටිනාකම රු.70,989,853 ක් ලෙස දක්වා තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයෙන් 2021 වර්ෂය සඳහා ලැබිය යුතු රු.960,000 ක ගොඩනැගිලි කුළී ගිණුම්ගත කර නොතිබීමෙන් ලැබිය යුතු කුළිය හා සම්මුච්චිත ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණු අතර එම මණ්ඩලය විසින් 2019 වර්ෂයේ සිට 2022 මැයි දක්වා කාලයට අදාළ බදුකුලී මුදලින් නව ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා දරන ලද වියදම් වෙනුවෙන් හිලව් කර ගෙන තිබුණු රු. 13,120,000 ක මුදල ගිණුම්ගත කිරීමට හා හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද නව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් එම මණ්ඩලයට ගෙවිය යුතු මුදල හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. 2023 වර්ෂයේදී ගිණුම්වලින් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ගොඩනැගිලි කුළී නිවැරදිව ගිණුම්ගත කිරීමට හා හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පැවති රු. 20,654,773 ක් වූ සේවක ණය ශේෂය තුල රු.545,052 ක හඳුනාගත නොහැකි ණය ශේෂයක් පැවතුණි | හඳුනාගත නොහැකි ණය ශේෂය තුළ පැවති රු.5,830 වෙනස හඳුනා ගැලපීම් කර ඇත. එහෙත් ප්‍රධාන ලෙජරය හා උපලෙජරය අතර වසර 20 කට වඩා පැරණි රු.539,221 ක හඳුනාගත | ණය කමිටු තිරණ මත හඳුනා නොගත් සේවක ණය ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට පියවරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නොහැකි ශේෂයක් ඇත. ඒ සඳහා කටයුතු කිරීමට අභ්‍යන්තර විගණක අංශයෙන් උපදෙස් ඉල්ලා සිටියද එම අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතින බැවින් කටයුතු කල නොහැකි විය. ණය කමිටු තිරණ මත ඉදිරියේදී කටයුතු කරනු ඇත. | |
| (එ) | සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද පාරිතෝෂික දීමනා රු. 2,323,223 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු.2,737,750 ක් ලෙස දක්වා තිබුණු අතර ඒ අනුව රු. 414,527 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණය නිවැරදිය පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමේ ඇතුලත්ව ඇත්තේ නිලධාරීන් දෙදෙනෙකු වෙත ගෙවන ලද පාරිතෝෂික මුදලින් ඔහු විසින් ලබාගත් ණය පියවීම් වන ඇති අතර එක් නිලධාරීයෙකු වෙත ගෙවා ඇත්තේ ඔහුට හිමි පාරිතෝෂික මුදල් වේ. එම නිසා මෙම මුදල් ගෙවීම් කල ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සඳහන් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල මුදල් නොවන වෙනස්වීම් යටතේ ගැලපිය යුතු පාරිතෝෂික සඳහා වෙන්කිරීම්වල වැඩිවීමේ වටිනාකම රු. 2,009,657 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල ගලපන ලද එම වටිනාකම රු. 2,669,937 ක් විය. | පාරිතෝෂික ගණනය කිරීමේදී සේවකයන්ගේ වැටුප් වර්ධක / වැටුප් වැඩිවීම ඔහුගේ සේවා කාලයට ගලපන බැවින් පෙර වර්ෂය සඳහා ගැලපීම් සිදුකරනු ලබයි. එම සම්පූර්ණ මුදලම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) ණයහිමියෝ | 330,280,811 | 364,301,563 | 34,020,752 | නිරීක්ෂණය නිවැරදිය. නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |
| (ආ)චිත්‍රපට කුලී ණයගැතියෝ | 411,680,539 | 439,289,504 | 27,608,965 | නිරීක්ෂණය නිවැරදිය. 2023 වර්ෂයේදී රු. 1,387,564 ක් නිරවුල් කර ඇත. | වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | ඉතිරි ශේෂයද නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |

### 1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ වියදම් පියවා ගැනීමට ආදායම් ප්‍රමාණවත් නොවීම මත 2001 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයෙන් සේවක වැටුප් හා ප්‍රාග්ධන වැය සඳහා ප්‍රතිපාදන සලසාදී තිබුණි. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක කාලය තුළ සංස්ථාව භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර දිගින් දිගටම මෙහෙයුම් අලාභ ලබන තත්ත්වයක පැවතීම හේතුවෙන් වර්තමානය වනවිට රජයේ මූල්‍ය සහය හා කෙටිකාලීන තැන්පතු පොළී ආදායම් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය. | සංස්ථාව සතුව පැවති චිත්‍රපට බෙදාහැරීමේ කටයුතු මණ්ඩල 05 කට බෙදීයාම හේතුවෙන් සංස්ථාවට ලැබුණු ආදායම අහිමි වීම මත මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමට සිදුවිය. ඉදිරියේදී අදායම් මාර්ග සකස් කරගෙන මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබාගැනීම අවම කර ගැනීමට කටයුතු කරනු ඇත. | සංස්ථාවේ ආදායම් වැඩිදියුණු කර ගැනීමටත්, සංස්ථාවේ පැවැත්ම පිළිබඳ ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමටත්, පනත ප්‍රකාරව වූ කාර්යයන් ඉටු කිරීමටත් ක්‍රියා කළ යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ)වියදම්/ආදායම් | 599,276,716 | ජර්නල් වවුචර් 135 කට අදාල අනුෂාංගික ලේඛන/ලිඛිත සනාථන | ජර්නල් වවුචර් සමඟ අනුෂාංගික ලේඛන අමුණා නොතිබුණද වැඩ ලිපිගොනුව තුල මෙම ලේඛන අමුණා ඇත. 2023 වර්ෂයේ සිට නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ අනුෂාංගික ලේඛන සමඟ ජර්නල් වවුචර් ඉදිරිපත් කිරීමට පියවරගත යුතුය. |
| (ආ)ණයගැති ගිණුම-<br>හර කිරීම්<br>බැර කිරීම් | <br><br>329,577,291<br>291,649,659 | ජර්නල් වවුචර් | පිළිතුරු ලබාදී නැත. | අනුමත කළ ජර්නල් වවුචර් මගින් ලේජර් ගිණුම්වල ගැලපීම් සිදු කිරීමට පියවරගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ)චිත්‍රපට කුලී ණයගැති අධිභාර වෙන්කිරීම් | 161,855,343 | උපලේඛන | වාර්ෂිකව අයකරනු ලබන අධිභාර එකතුවෙන් 75% අයනොවේයැයි පදනම මත බැර කර ඇත. මේ සඳහා වෙන වෙනම උපලේඛන සකස් කර නොමැත. 2001 දී මණ්ඩල වලට යාමට පෙර පැවති ශේෂයන් පමණක් පරිගණකයට ඇතුලත් කර ඇති අතර කාලවිශ්ලේෂණය සිදුකර නොමැත. මෙම ශේෂ අවුරුදු 21 කට වඩා පැරණිය. | අධිභාර වෙන්කිරීම් තහවුරු කර ගැනීමට අදාල උපලේඛන සමඟ වයස් විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ)පැරණි චිත්‍රපට කුලී ණයගැතියෝ | 27,789,043 | වයස් විශ්ලේෂණ | | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 05 කට පෙර සිට පැවත එන සංස්ථාවේ සුබසාධන සංගමයෙන් ලැබිය යුතු රු. 354,000 ක් හා ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලෙන් ප්‍රදර්ශිත චිත්‍රපට වෙනුවෙන් ලැබිය යුතු රු. 1,360,404 ක් අයකරගත නොහැකි ශේෂය තුල දක්වා තිබුණි. සංස්ථාවේ අභ්‍යන්තර අංශ අතර සිදු වූ ගනුදෙනු මත ඇතිව තිබූ මෙම ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සුභසාධක සංගමයෙන් ලැබිය යුතු මුදල් සම්බන්ධව ගෙවීම් කරන ලෙස ලිඛිතව දන්වා ඇත. සංවර්ධන අරමුදලෙන් නිෂ්පාදිත චිත්‍රපට ප්‍රදර්ශිත ආදායම අඩුවීම මත අයකරගැනීමට නොහැකි වී ඇත. | ලැබිය යුතු ණය ශේෂයන් අයකර ගැනීමට පියවරගත යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.44,917,713 ක් වූ උපචිත වියදම් වලින් රු. 4,523,718 ක උපචිත වියදම් වසර 05 කට පෙර සිදු වූ ගණුදෙනු වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා විය. මෙම උපචිත වියදම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. කොටසක් නිවැරදි කිරීම් සිදුකර ඇති අතර 2023 වර්ෂයේදී ඉතිරිය නිරවුල් කිරීමට කටයුතු කරමි. | උපචිත වියදම් කඩිනමින් ගෙවීමට/ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 4 (ඌ) වගන්තිය | ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත චිත්‍රපට සම්බන්ධයෙන් වෙළඳපොල පර්යේෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ ව්‍යාපෘති සඳහා මාතෘකා තෝරාගෙන ඇති අතර එම ව්‍යාපෘති සම්බන්ධයෙන් කොළඹ විශ්ව විද්‍යාලය සමඟ සාකච්ඡා කිරීමට අපේක්ෂිතය. | වෙළඳපොල පර්යේෂණ කටයුතු සිදු කිරීමට කඩිනම් පියවරගත යුතුය. |
| (ආ) | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(අ) සහ (ආ) ඡේද | 2021 වර්ෂය වන විට සංස්ථාව සතුව මෝටර් රථ 14 ක් පැවති අතර, 2020 වර්ෂයේ සිටම වාහන 06 ක් ධාවනයෙන් ඉවත් කර තිබුණි. 2022 වර්ෂය වන විට මෝටර් රථ 05 ක් පමණක් ධාවනයේ යොදවා තිබූ අතර, මෙම චක්‍රලේඛය ප්‍රකාරව අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ ධාවනය නොකරන වාහන අපහරණය කිරීමට ක්‍රියාකර නොතිබුණි. | මේ වන විට මෝටර් රථ කිහිපයක් අලුත්වැඩියා කර ධාවනයට යොදා ඇත. ඉතිරි වාහන ඉදිරියේදී අපහරණය කිරීමට නියමිතය. | චක්‍රලේඛය ප්‍රකාරව ධාවනය නොකරන වාහන අපහරණය කිරීමට පියවරගත යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි 2.3 ඡේදය | ජාතික චිත්‍රපට සංස්ථාවේ 2022 වර්ෂය ආවරණය කරමින් උපාය මාර්ගික සැලැස්මක් සකස් කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. 2022 වර්ෂය ආවරණය කරමින් උපාය මාර්ගික සැලැස්මක් සකස් කර නොතිබුණි. කරුණු එසේ වුවද 2023 - 2025 දක්වා සංයුක්ත සැලැස්ම සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර එහිදී පෙන්වා දෙනු ලැබූ අඩුපාඩු නිවැරදි කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ මාර්ගෝපදේශකත්වයෙන් මේ වන විට කටයුතු සිදුකරමින් පවතී. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමට කඩිනම් පියවරගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 30,688,601 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 9,417,553 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 21,271,048 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ ආදායම් රු. 81,719,646 කින් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදනය සහ සිනමාශාලා නවීකරණය සඳහා ලබාදී ඇති ණය මුදල් වලින් එකතුව රු. 83,517,103 ක් සහ සිනමාශාලා වලින් ලැබිය යුතු හිඟ මුදල් රු.411,680,538 ක් ඇතුළුව එකතුව රු.495,197,641 ක ලැබිය යුතු මුළු මුදලින් එකතුව රු. 348,464,266 ක් අධිභාර සහ අඩමාණ ණය ලෙස වෙන්කිරීම නිසා එදිනට අයකරගත හැකි ශුද්ධ ණය ශේෂය රු. 146,733,375 ක් විය. තවද විගණනයට ඉදිරිපත් කරන ලද සිනමාශාලා ණයගැති කාල විශ්ලේෂණයට අනුව රු. 214,135,368 ක ණයගැති ශේෂ වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන අතර එම මුදල් විධිමත්ව හා කාලීනව අයකර ගැනීමට සංස්ථාව විසින් පියවර ගෙන නොතිබුණි. | මෙම සිනමාශාලා වලින් දැනට ක්‍රියාත්මක වනුයේ 143 වැනි ප්‍රමාණයකි. ඉතිරි සිනමාශාලා සියල්ලම වසා දමා ඇති අතර ඒවායේ හිමිකරුවන් සොයා ගැනීමට නොහැක. දැනට ක්‍රියාත්මක සිනමාශාලා වලින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. වසා දමා ඇති සිනමා ශාලාවලින් ද හිඟ මුදල් අයකරගැනීම කටයුතු කරමින් සිටී. | ණය වාරික හා පොළී අයකර ගැනීම පිළිබඳ වූ ක්‍රියාවලිය විධිමත් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | සංස්ථාව වෙත ලැබිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා කමිටුවක් පත්කර තිබූ අතර විගණිත දින වූ 2023 සැප්තැම්බර් 05 දින වන විටත්, 2023 වර්ෂය වෙනුවෙන් කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. හිඟ මුදල් අයකර ගැනීමට අදාල නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුව අපොහොසත් වී තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ආසන්න වසර 10 ක හිඟ ණය සහ හිඟ මුදල් විධිමත් ක්‍රමවේදයකට අනුව අයකර | බුද්ධ ශාසන අමාත්‍යාංශය යටතේ පැවති සමයේ අමාත්‍යාංශ නියෝජනයක් සමඟ ණය කමිටුව එක් අවස්ථාවක දී රැස් විය. අමාත්‍යාංශ වෙනස්වීම මත ණය කමිටුව නියෝජනය කරනු ලබන අමාත්‍යාංශ නියෝජනය නම් කර නොතිබීම මත මෙය ප්‍රමාද වී ඇත. සංස්ථාවේ කමිටු සමාජිකයන් කිහිප අවස්ථාවක රැස්වීම් කටයුතු කරන ලදි. | ණය අයකර ගැනීමේ කමිටු තීරණ කඩිනමින් ලබාගැනීමට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු උපදෙස් ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින්ද උපදෙස් ලබාදී තිබුණද එම උපදෙස් ප්‍රකාරව හිඟ ණය අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කුරුඳුවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මු.ති.කො. 9848 දරන පිඹුරේ කැබලි අංක 01 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.1235 ක ඉඩමෙහි පිහිටා තිබුණි. මෙම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සංස්ථාව වෙත පවරා ගැනීමකින් තොරව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය ඇතුළු ගොඩනැගිලි කිහිපයක් ඉදිකර එහි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි. | කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි 7702 දරන පිඹුරේ හෙක්ටයාර් 1.0642 වූ කැබලි 02 හෙක්ටයාර් 0.8425 ක් වූ කැබලි අංක 04 දරන රජයේ ඉඩම් කොටස් 02ක 2000 මැයි 16 දින විශේෂ දීමනා පත්‍රයක් මගින් මෙම සංස්ථාව වෙත පවරා දී ඇති ඉඩම, ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ ලියාපදිංචිය සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් 2007.10.29 දින ඉදිරිපත් කර ඇති අතර ඉඩමෙන් කොටසක් තර්ස්ටන් විද්‍යාලීය රග්බි ක්‍රීඩාංගනය සඳහා ලබා දෙන ලෙස සිටි අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගය පරිදි හිටපු ජනාධිපති ලේකම් විසින් 2007.12.08 දින දන්වා තිබූ හෙයින් එම කොටස ඉවත් කර ඉතිරි කොටස සඳහා යලි පිඹුරුපත් සකසා ඊට අදාලව නීත්‍යානුකූල හිමිකම් ඔප්පුව ලබාගැනීමට කටයුතු කර තිබුණද මේ දක්වාම අදාල හිමිකම් ඔප්පුව ලබාදීමට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොමැත. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | තොග සමීක්ෂණ පත්‍රිකා අනුව භෞතිකව නොමැති රු.5,253,887 ක් වටිනා චිත්‍රපට තොගයක් අවසාන තොගය තුල ඇතුලත්ව තිබූ අතර එම තොග සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරිමට පියවර ගෙන නොතිබුණි. | 2023 වර්ෂයේදී ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | භෞතිකව නොමැති චිත්‍රපට තොගය පිලිබඳ වග කිව යුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය කටයුතු කළ යුතුය. . |
| (ඈ) | දේශිය හා විදේශීය චිත්‍රපට බෙදාහැරීමේ කොමිස් මුදල සංස්ථාවේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රයක් වන අතර කාලයක් තිස්සේ පෞද්ගලික ආයතන මගින්ද චිත්‍රපට බෙදාහැරීම සිදුකර තිබුණි. අංක අමප/21/1024/305/022 හා 2021 ජුනි මස 14 දිනැති අමාත්‍ය මණ්ඩල | “ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය සහ ඒ පිළිබඳ මාර්ගෝපදේශය” අහෝසි කිරීමට අමාත්‍ය මණ්ඩලය ගනු ලැබූ තීරණය සහ ඊට විරුද්ධව ඇති වූ අධිකරණ ක්‍රියාමාර්ගයන් සංස්ථා පාර්ශවයට වාසි දායක අයුරින් විසඳා ගැනීම සඳහා සංස්ථාව උපරිමයෙන් කටයුතු කරන ලද අතර, අධිකරණ | සංස්ථාවේ අභිවෘද්ධිය සඳහා අමාත්‍ය මණ්ඩලය ලබාදුන් තීරණය ක්‍රියාවේ යෙදීමටත්, ඒ සඳහා වන |

| | | |
|---|---|---|
| තීරණය මඟින් චිත්‍රපට බෙදාහැරීම හා ප්‍රදර්ශනයට අදාල ක්‍රමවේදය සංස්ථාවට පවරා ගැනීමට අනුමැතිය ලබාදී තිබුණද විගණිත දින වූ 2023 සැප්තැම්බර් 30 දක්වා යථෝක්ත කරුණ ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කර ක්‍රියාත්මක කිරීමට සංස්ථාවේ ඉහළ කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | නියෝගය පරිදි චිත්‍රපට බෙදාහැරීම සහ ප්‍රදර්ශනයට අදාල ක්‍රමවේදය සකස් කර එම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. කෙසේ වුවද චිත්‍රපට බෙදාහැරීමේ ක්‍රියාවලිය සංස්ථාවට පවරා ගැනීම සඳහා අදාල ගැසට් නිවේදනය සකස් කර රේඛීය අමාත්‍යවරයාගේ (අග්‍රාමාත්‍යවරයාගේ) අත්සනට ඉදිරිපත් කරන ලදි. කෙසේ වුවද මේ සඳහා මෙතෙක් ප්‍රතිචාර ලැබී නොමැත. | ගැසට් පත්‍රය නිකුත් කිරීමටත් ඉහළ කළමනාකරණය ක්‍රියා කිරීම සුදුසු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාවට අයත් අංක 224 දරන පරිශ්‍රයේ පිහිටි තනි මහල් ගොඩනැගිල්ල 2007 වර්ෂයේ සිට ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය වෙත බදු කුළී පදනමට ලබාදී තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් බදු ගිවිසුමේ සහ 2017 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලය වෙනුවෙන් 2017 ජනවාරි 23 දින අතර ඇති කරගත් බදු ගිවිසුමේ ඇතුලත් කොන්දේසි පිළිපැදීමට දෙපාර්ශවය විසින් එකඟවී ඇතත් ගිවිසුමේ සඳහන් අංක 06 හා 08 කොන්දේසි කඩ කරමින් බදුදී තිබූ ගොඩනැගිල්ල කඩා ඉවත් කර වර්ග අඩි 2576 ක නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව කටයුතු කර ඇත. | නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර අදාල අනුමැතින් ලබා ගත යුතු අතර මෙම කරුණ පිළිබඳ වගකිව යුතු පාර්ශවයන් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත්, සංස්ථාව සතු වත්කම් ආරක්ෂා කිරීමටත් කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 224 දරන පරිශ්‍රයේ පිහිටි නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ මූලික කටයුතු 2016 මැයි 16 දින ආරම්භ කර 2017 ජනවාරි 08 දින මුල් ගල තබා තිබුණු අතර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර වසරක පමණ කාලයක් ගතවීමෙන් පසු 2017 අප්‍රේල් 27 දින පාලක මණ්ඩලය විසින් ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල අනුමැතිය ලබාදීම තහවුරු කර තිබුණි. එසේ වුවද දෙපාර්ශවය විසින් , නව ගොඩනැගිල්ල | නිරීක්ෂණය නිවැරදිය. සාකච්ඡා කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | නව ගොඩනැගිල්ල ඉදිකිරීම, එහි අයිතිය හා වියදම් පියවීම සම්බන්ධ කොන්දේසි ගිවිසුමට ඇතුලත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉදිකිරීම, එහි අයිතිය හා වියදම් පියවීම සම්බන්ධ කොන්දේසි ඇතුලත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | | |
| (ඇ) | නව කුලී ගිවිසුමක් ඇති කර ගැනීමට අදාල තක්සේරු වාර්තා ලබාගැනීමේ ප්‍රමාදය හේතුවෙන් 2019 ජනවාරි 01 දින සිට 2022 මැයි 31 දක්වා කාල සීමාවට අදාලව බදු කුලිය සඳහා ගිවිසුම්ගත වී නොතිබුණි. විධිමත් ගිවිසුමකට එළඹෙන තෙක් සංශෝධනයන්ට යටත්ව 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ඇස්තමේන්තුගත රු. 400,000 ක් වූ මාසික කුලියෙන් සියයට 20 ක් මුදලින් හා ඉතිරි සියයට 80 ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වෙනුවෙන් දරන ලද පිරිවැයට හිලව් කිරීමටත් දෙපාර්ශවය එකඟ වී තිබුණ ද 2023 මාර්තු 14 වන තෙක්ම බදු ගිවිසුමකට එළඹීමට අපොහොසත්ව තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. සාකච්ඡා කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | බදු කාලය අවසන්වීමට පෙර නව තක්සේරු ලබා ගෙන නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය |
| (ඈ) | අවසන්වරට ඇතුලත්ව තිබූ ගිවිසුම අවසන් වී වසර 04 කට පසු 2022 ජූනි 01 දින සිට 2024 මැයි 31 දින දක්වා වසර 02 ක කාලසීමාව වෙනුවෙන් 2023 මාර්තු 14 දින නව ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුමේ ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයට ගෙවිය යුතු මුදල පිළිබඳව කොන්දේසි ඇතුලත් කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. සාකච්ඡා කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයට ගෙවිය යුතු මුදල පිළිබඳව කොන්දේසි ගිවිසුමට ඇතුලත් කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 23 දින පැවති අංක 1204 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ධාවනයෙන් ඉවත් කර තිබූ GB- 1371 වෑන් රථය විධිමත් පටිපාටින්ට අනුව අළුත්වැඩියා කර භාවිතයට ගැනීම සඳහා අනුමැතිය ලබාදී තිබුණද අවුරුදු 02 කට | මෙම රථය වෙන්දේසි කිරීම සඳහා මුල් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය අත්හිටුවා පසුව 2021 නොවැම්බර් 23 අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන තිබුණද ඒ වනවිට | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට පියවරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආසන්න කාලයක් ගත වී ඇතත් මෙම වෑන් රථය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩාගාරයේ රාජ්‍ය වියදම් සීමාකිරීම් යටතේ නිකුත් කර තිබූ චක්‍රලේඛ හේතුවෙන් මෙම රථය අලුත්වැඩියාව සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම් සිදුනොවීය. මේ වනවිට අදාල රථය අලුත්වැඩියාව සඳහා යොමුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී. | |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 870,659 ක් වූ දළ සේයාපට සහ රසායනා ද්‍රව්‍ය තොගය 2014 වර්ෂයේ සිට කාලය ඉකුත්වීම සහ වර්තමානයේ භාවිතා නොකිරීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක පැවති අතර පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද මේ පිලිබඳව පෙන්වා දී තිබුණද, මෙම නිෂ්කාර්යය වත්කම් අපහරණය කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. මෙම වත්කම් හඳුනාගෙන ඇති අතර නිසි ක්‍රමවේදයකට අපහරණය කිරීමට නියමිතය. | ප්‍රයෝජනයට ගත නොහැකි තොග සමීක්ෂණ මණ්ඩල තිරණ හා පවත්නා නිති රීති අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සංස්ථාවට අයත් අංක 224 දරන පරිශ්‍රයේ පිහිටි දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහල අංක 4660 දරන බදු ගිවිසුම ප්‍රකාරව 2019 ජනවාරි 14 දින දක්වා මසයකට රු. 315,000 ක බදු කුළී ගෙවීමේ පදනම මත සැලසිනේ රූපවාහිනී ආයතනය වෙත ලබාදී තිබුණි. බදු ගිවිසුම යාවත්කාලීන කිරීමකින් තොරව සහ එකතුව රු.12,111,000 ක් වූ හිඟ බදු මුදල් ගෙවීමකින් තොරව ගොඩනැගිල්ල භාවිතා කර 2022 මාර්තු 28 දින ගොඩනැගිල්ල නැවත සංස්ථාව වෙත භාරදී තිබුණි. 2023 මැයි මස දක්වා මෙම හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, 2022 මාර්තු 28 දිනෙන් පසුව මෙම ගොඩනැගිල්ල ඵලදායී කාර්යයක යොදවා නොතිබුණි. | 2014 ජනවාරි 14 සිට 2019 ජනවාරි 14 දක්වා මසකට රු. 315,000 බැගින් බදු කුලි ගෙවීමේ පදනම මත සැලසිනේ රූපවාහිනී ආයතනය සංස්ථාව සමඟ අංක 4660 දරණ බදු ගිවිසුම ගිවිසගෙන ඇත. ඉන්පසුව බදු ගිවිසුම් යාවත්කාලීන කිරීමක් සිදුකර නොමැත. 224 ගොඩනැගිල්ලේ තක්සේරු වාර්තා ලබාදුන්නද තක්සේරු වටිනාකම අනුව බදු කුළී ගෙවීමට එම ආයතනය එකඟවී නැත. ඔවුන් සමඟ කල සාකච්ඡාවකදී පෙර පැවති බදු කුලිය වූ රු 315,000 බැගින් හිඟ මුදල් ගෙවීමට එකඟ වී ඇත. ඉදිරියේදී ඵලදායී කාර්යයක යෙදවීමට නියමිතය. | හිඟ බදු මුදල් අයකර ගැනීමට හා ගොඩනැගිල්ල ඵලදායී කාර්යයක යොදවීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | සංස්ථාවේ ප්‍රධාන ගබඩාව තුළ වර්ෂ වසර 10 ඉක්මවූ චිත්‍රපට සඟරා 7,692 ක් ගබඩා ඉඩකඩ අසුරාලමින් නිශ්කාර්යව පැවතුණි. සංස්ථාවේ ලේඛන මඟින් පිරිවැය හෝ වර්තමාන අගය හඳුනාගත නොහැකි මෙම ද්‍රව්‍ය පිළිබඳ පූර්ව වර්ෂ විගණකාධිපති | සංස්ථා ප්‍රකාශන වල බොහෝමයක් ඇත්තේ වාර්ෂික වාර්තා වේ. ඉතිරි පොත් විකිණීමට සහ පාසල් වෙත ප්‍රදානය කිරීමට කටයුතු කරනු ඇත. | පිළිතුරේ දක්වා ඇති පරිදි ඉතිරි පොත් විකිණීමට සහ පාසල් වෙත ප්‍රදානය කිරීමට හෝ අපහරණය |

| | |
|---|---|
| වාර්තාව මඟින්ද පෙන්වාදී තිබූ අතර, හානියට පත්වෙමින් පැවති මෙම ද්‍රව්‍ය අපහරණය කිරීමට කළමනාකරණය පියවර ගෙන නොතිබුණි. | කිරීමට ක්‍රියා කළ යුතුය. |

3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආචාර්ය "ලෙස්ටර් ජේම්ස් පීරිස්" මහතා නමින් සංස්ථා පරිශ්‍රය තුළ කෞතුකාගාරයක් සහ පුස්තකාලයක් ඉදිකිරීම සඳහා ඉදිකිරීම් සහ උපදේශනාත්මක කටයුතු වෙනුවෙන් එකතුව රු. 99,965,061 ක ඇස්තමේන්තුගත වටිනාකමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා දීමට ද්විපාර්ශවික ගිවිසුමකට එළඹ 2019 අප්‍රේල් 05 දින එහි ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියේ සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් රහිතව ආරම්භ කළ මෙම ඉදිකිරීම වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.3,134,107 ක් ගෙවීම් කර තිබුණි. පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වා දුන් මෙම ඉදිකිරීමේ කටයුතු වසර 04 කට වැඩි කාලයක සිට අතහැර දමා තිබූ අතර, ඉදිකිරීම් ආරම්භ කළ මෙම ගොඩනැගිල්ලේ ඇති යකඩ කූරු දැඩි ලෙස හායනයට ලක්වීම නිසා ගොඩනැගිල්ල විනාශ වෙමින් පැවතුණි. | මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් ඇස්තමේන්තු සකස් කර ද්විපාර්ශවික ගිවිසුමක් මත කටයුතු කර ඇත. දැනට ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් ව්‍යාපෘතිය ඇනහිටී ඇත. මේ සඳහා විමර්ශනයක් සිදු වෙමින් පවතී. | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර 2021 ජූලි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ලබාදුන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ III වන කොටස 16 (2) ඡේදය සහ 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම්, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සංස්ථාවේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 05 ක ප්‍රමාදයකින් පසුව 2023 ජූලි 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. අමාත්‍යාංශ මාරුවීම හේතුවෙන් 2021 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන රජයේ විගණක වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයන්ට සකස් කර අවසන් වුවද 2021 වර්ෂයට අදාල විගණකාධිපති මතය ලබා දෙනතුරු 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. | ජාතික විගණන පනත හා චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |

## 4.2 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1971 අංක 38 දරන මුදල් පනතේ වගන්ති අංක 14 සහ 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්ති අනුව අදාළ මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත භාෂා 03 කින් යුත් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව තුළ සභාගත කළ යුතු වුවද, සංස්ථාවේ 2018, 2019 සහ 2020 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2018 හා 2019 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අදාල අමාත්‍ය මණ්ඩල තීරණයේ පිටපතක් 2023.10.04 දින ලැබී ඇති අතර ගරු ඇමතිතුමාගේ අත්සනින් යුතු ආවරණ ලිපිය ලද පසු අදාල වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරපත් කරනු ලැබේ. 2020 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ VII වන කොටස 40 (1) ඡේදය ප්‍රකාරව අදාළ ආයතනය සඳහා තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු වුවද, 2021 දෙසැම්බර් වන විට අභ්‍යන්තර විගණක සහ අභ්‍යන්තර විගණන අංශයේ සේවය කළ නිලධාරිනිය සංස්ථා සේවයෙන් ඉවත් වීමෙන් පසුව සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය අක්‍රියව පැවතිණි. | නිරීක්ෂණය නිවැරදිය. රජය විසින් නව බඳවාගැනීම් සඳහා අනුමැතිය ලබා දී නොමැත. ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරනු ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |